**පොලිස් ත්‍යාග අරමුදල - 2015**

**-----------------------------------**

පොලිස් ත්‍යාග අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ අනෙකුත් වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පොලිස් ආඥාපනතේ 74 (4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ඉහත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ .මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ .තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නාලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**-------------------**

**2.1** **තත්ත්වාගණනය කළ මතය**

**-------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට පොලිස් ත්‍යාග අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2.** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**-----------------------------------------------**

**2.2.1** **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**---------------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පොලිස් අනුග්‍රාහක අරමුදලට ලබා දී තිබුණු රු.2,000,000 ක අත්තිකාරමක් නිරවුල් කර ගැනීම සඳහා විධිමත් පියවර ගැනීමෙන් තොරව වර්ෂ 16 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි.

(ආ) නෛතික ක්‍රියාමාර්ග අවසන් නොවීම හේතුවෙන් 2001 වර්ෂයට අදාළව එකතුව රු.33,241,336 ක් වූ විශේෂ ත්‍යාග සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අදාළ නිලධාරීන්ට ගෙවා නොතිබුණි.

**2.2.2** **නොසැසඳූ පාලන ගිණුම්**

**-------------------------------**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ස්ථාවර වත්කම් මත ලැබිය යුතු පොලී සහ පොලිස් මූලස්ථානයේ ත්‍යාග අංශය විසින් ඉදිරිපත් කරන ලද උපලේඛන අතර රු. 1,150,000 ක වෙනසක් නිරීක්ෂණය විය. කෙසේ වුවද, මෙම ශේෂයන් දෙක සැසඳීම සඳහා පියවර ගෙන නොතිබුණි.

**3.** **මූල්‍ය සමාලෝචනය**

**----------------------**

**3.1** **මූල්‍ය ප්‍රතිඵල**

**---------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.909,174,670 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.896,375,737 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ රු.12,798,933 ක වර්ධනයක් දැක්වුණි. සමාලෝචිත වර්ෂය තුළ ත්‍යාග ගෙවීම් සැලකිය යුතු ලෙස අඩුවීම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

**------------------------------**

**4.1** **කාර්යසාධනය**

**--------------------**

**ත්‍යාග ගෙවීම**

**-----------------**

අරමුදලේ ප්‍රධාන අරමුණු වන්නේ ත්‍යාග ලබාදීම මඟින් ප්‍රධාන පොලිස් පරීක්ෂක ධූරයට පහළ පොලිස් නිලධාරීන්ගේ රාජකාරීන් කාර්යක්ෂම ආකාරයෙන් සිදුකර ගැනීම සඳහා පොලිස් නිලධාරීන් ඒ සඳහා පෙළඹවීම හා පොලීසියට අවශ්‍ය තොරතුරු ලබා දෙන සිවිල් පුද්ගලයන් සඳහා ත්‍යාග ගෙවීම්

සිදු කිරීමයි. මෙම අරමුණු සඳහා සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂ 5 ක් තුළ කරන ලද ත්‍යාග ගෙවීම් පහත දැක්වේ.

| | | 2015 | 2014 | 2013 | 2012 | 2011 | 2010 |
|---|---|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| (i) | පොලිස් නිලධාරීන් සඳහා ත්‍යාග ගෙවීම | 400.6 | 415.3 | 422.7 | 585.2 | 534.8 | 407.2 |
| (ii) | පොලිස් නිලධාරීන් හා සිවිල් පුද්ගලයන් සඳහා විශේෂ ත්‍යාග ගෙවීම | 17.3 | 15.5 | 12.1 | 33.1 | 28.1 | 28.4 |
| (iii) | පොලිස් නිලධාරීන් සඳහා ගෙවූ මෝටර් රථ ප්‍රවාහන ත්‍යාග | 148.2 | 163.1 | - | - | - | - |
| | එකතුව | 566.1 | 593.9 | 434.8 | 618.3 | 562.9 | 435.6 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පොලිස් නිලධාරීන් හා සිවිල් වැසියන් සඳහා වාර්ෂිකව ත්‍යාග ගෙවා තිබුණද ත්‍යාග ගෙවීම් ලද පුද්ගලයන්ගේ සංඛ්‍යාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) පසුගිය වර්ෂ 4 සඳහා පොලිස් නිලධාරීන් වෙනුවෙන් ත්‍යාග ගෙවීම් අනපේක්ෂිත ලෙස අඩු වී තිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 5.1 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත සහ තථ්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර පොලිස්පතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.

| | | | |
|---|---|---|---|
| (අ) | මුදල් පොත පවත්වා ගැනීම. | - | අවස්ථා කිහිපයකදී මකන තීන්ත යොදා ගැනීම මඟින් මුදල් පොතේ වෙනස්කම් කර තිබුණි. |
| (ආ) | මෝටර් රථ ප්‍රවාහන දඩ මුදල් ගිණුම් තැබීම. | - | ප්‍රමාදයකින් තොරව දඩ මුදල් එකතු කිරීම සහ ගිණුම්වල සුදුසු ගැලපීම් සිදුකිරීම. |